www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජර්මනිය: චාන්සලර් මර්කෙල් යටතේ මහා සභාගය

## Germany: Grand Coalition under chancellor Merkel

**උලි රිපර්ට්**

**2005 ඔක්තෝබර් 12**

සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (එස්පීඩීය) සමග වන මහා සභාග ආන්ඩුවක චාන්සලර්වරිය ලෙස ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදී සංගමයේ (සීඩීයූවේ) නායිකා ඇන්ජලා මර්කෙල් පත් කිරීමේ තීන්දුව ජර්මානු ඡන්දදායකයට එරෙහිව යුද ප්‍රකාශ කිරීමක් නියෝජනය කරයි. සැප්තැම්බර් 18 වන දා ප්‍රාන්ත මැතිවරනයේ දී අතිවිශාල බහුතරයක ඡන්ද දායකයෝ මැකරල්ට ද සීඩීයූවට ද එරෙහිව සිය ඡන්දය ප්‍රකාශ කලෝ ය.

ජර්මානු සුභසාධක රාජ්‍යයට ආන්ඩුවෙන් එල්ල කෙරුනු අනවරත ප්‍රහාරයන්ට එරෙහිව ඡන්ද දායකයන් සිය සුපැහැදිලි විරෝධය සනිටුහන් කිරීම මගින් ජර්මනියේ ඉවත්ව යන එස්පීඩී-හරිත ආන්ඩුව ද මැතිවරනයේ ගොදුරක් බවට පත් කෙරින. සැප්තැම්බර් මැතිවරනයේ දී වැඩියෙන් ම පහර කෑ පක්ෂ දෙක (එස්පීඩී, සීඩීයූ), ඡන්දදායක බහුතරය විසින් ඇස්පනාපිට ම ප්‍රතික්ෂේප කර දමන ලද පිලිවෙත් ක්‍රියාවට නංවනු පිනිස සභාග ආන්ඩුවක් අටවා ගැනීම සඳහා ඒකාබද්ධ වෙමින් සිටියි.

පසු ගිය සති කීපය තුල දී ආන්ඩුව පිහිටුවා ගැනීම පෙර නුවූ විරූ රහසිගත වටපිටාවක දී කරනු ලැබුයේ මේ හේතුව නිසා ය. ඇන්ජලා මර්කෙල් චාන්සලර්වරිය ලෙස පත් කිරීමේ තීන්දුව ගනු ලැබුවේ හුදෙක් පුද්ගලයන් සිව් දෙනෙකුගේ එකතුවෙනි. ඒ, ඇන්ජලා මැකරල් (සීඩීයූ), එඩ්මන්ඩ් ස්ටොයිබර් (ක්‍රිස්තියානි සමාජ සංගමය [සීඑස්යූ]) හා ප්‍රාන්ස් මූන්ටෆෙරිං (එස්පීඩී) සමග ඉවත්ව යන චාන්සලර් ගර්හාඩ් ශ්‍රෲඩර් (එස්පීඩී) යන අය ය. ඉහල මට්ටමේ සමුලු ‘පරම රහස්‍ය භාවය ‘ රැකීමේ දිව්රුම්වලින් තොරතුරු කාන්දු නොවන සේ මුද්‍රා තැබිනි. තමන් කොල්ල කා ගත් දෙය බෙදා ගන්නා හොර නඩයක් මෙන් දේශපාලනඥයෝ බලය සහ ආනුභාවය මෙන් ම ඇමතිකම් ද බෙදාහදා ගැනීම පිනිස මහජනයාට හොරෙන් රහසේ කතා බහ කලහ.

ඍජුව පැවසුව හොත්, මෙම ආන්ඩුව පිහිටුවීම මහජනයාට එරෙහි කුමන්ත්‍රනයක ස්වභාවය ගත්තේ ය. නැත හොත්, වඩාත් නිශ්චිතව පවසන්නේ නම්, නියමිත කලට පෙර මැතිවරනයක් කැඳවීම හරහා පසු ගිය මැයි මාසය වන විටත් ආරම්භ කෙරී පැවති කුමන්ත්‍රනය මෙම ආන්ඩුව පිහිටුවීම මගින් කූටප්‍රාප්තියට පත් විය.

මර්කෙල් යටතේ මහා සභාගයක් ඇටවීමෙන් දැන් අවසානයක් කරා ලඟා වී ඇති සමස්ත සිදුවීම් දාමය යලි සිහිපත් කර ගැනීම වැදගත් ය. මැයි මස දී කලින් ඡන්දයක් පැවැත්වීමට චාන්සලර් ශ්‍රෲඩර් කල මවිතකර කැඳවීමට හේතු වූ කාරනා දෙකක් වී ය.

එක් අතකින්, ඔහුගේ සුභසාධන කප්පාදුවේ වැඩ පිලිවෙලට -- 2010 න්‍යාය පත්‍රය හා සිව් වන හාට්ස් නීති සංග්‍රහයට -- එරෙහිව වැඩෙන ජනතා විරෝධයකට ඔහු මුහුන දී සිටියේ ය. අප්‍රේල් මස උතුරු රයින්-වෙස්ට්ෆේලියා ප්‍රාන්තයේ එස්පීඩීය ලැබූ පරාජය එක දිගට ඔවුන් ලද එකොලොස් වන මැතිවරන පරාජය වූ අතර සාම්ප්‍රදායික එස්පීඩී බලකොටුවක් වූ මෙම ප්‍රාන්තයේ ආන්ඩුවේ පිලිවෙත්වලට එරෙහි ජනතා විරෝධය සුවිශේෂිතව ම තියුනු ය.

අනෙක් අතට, ප්‍රමුඛ පෙලේ කාර්මික හා ව්‍යාපාරික කන්ඩායම් ජර්මානු සුභසාධන රාජ්‍යය මුලිනුපුටා දැමීම කඩිනම් කරවීමක් ඉල්ලා සිටියෝ ය. ඔවුහු ප්‍රාන්ත මැතිවරනය දක්වා වූ 18 මාසයක කාලය තුල දී ''ප්‍රතිසංස්කරන පිලිවෙත් නවතා තබා ගැනීමේ'' කුමන හෝ පියවරකට කර්කෂ ලෙස විරෝධය පෑ අතර ඉක්මන් විසඳුමක් ඉල්ලා සිටියහ. මෙම පීඩනයට ප්‍රතිචාරයක් ලෙසට, වසන්ත සමයේ ඡන්දයේ දී එස්පීඩීයට වඩා සියයට 22ක ප්‍රතිශතයක් ඉහලින් සීඩීයූ/සීඑස්යූ සිටි කොන්දේසි යටතේ බලය කොන්සවේටිව් විරුද්ධ පක්ෂයේ අතට ලබා දෙන්නාක් වැනි අයුරකින් කලින් මැතිවරනයක් කැඳවමින් ශ්‍රෲඩර් ආරම්භක වාසිය අත් කර ගැනීමට මාන බැලී ය.

කෙසේ වෙතත්, වරක් ජාතික මට්ටමෙන් සියයට 12ක ඡන්ද ගත්තා වූ ද රටේ නැගෙනහිර දිශාවේ අන් කවර පක්ෂයකට වඩා වූ සහයෝගයක් ලබා ගත්තා වූ ද අලුතින් පිහිටවූ වාමාංශික පක්ෂය ඡන්ද ව්‍යාපාරයට මැදිහත් වීමත් සමග තත්වය වෙනස් වී ය.

ඒ හා සමග ම, මර්කෙල් ඇගේ මූල්‍ය විශේෂඥයා ලෙස සමතලා-බදු ක්‍රමය අගය කරන පෝල් කර්ශොෆ් පත් කිරීමත් සමග ඇගේ ප්‍රතිපත්තිවල දක්ෂිනාංශික නව-ලිබරල් අන්තර්ගතය පැහැදිලි විය. එලෙස ම ඇය, වටිනාකමට එකතු කල බදු ඉහල දැමීම සහ එක් වර මුදලක් ගෙවීමේ ව්‍යාපෘතියක් හඳුන්වා දීම තුලින් ජර්මානු සහයෝගිතා-පාදක සෞඛ්‍ය පද්ධතියට තව දුරටත් වල කැපීම ද නිවේදනය කලා ය.

මැතිවරන ව්‍යාපාරය තුල දී "වාම" කතා පවත්වමින් ශෘඩර් ප්‍රතිචාර දැක්වූයේ ය. මැතිවරන රැස්වීම්වල දී එස්පීඩී චාන්සලර්වරයා තමන්ගේ ම ආන්ඩුවේ ප්‍රතිපත්තිවලට විරුද්ධව උද්ඝෝෂනය කරන්නාක් මෙන් "වැඩි සමාජ සාධාරනත්වය"ක් ඉල්ලා සිටීමෙන් අරුමපුදුම තත්වයකට පත් විය. කෙසේ වෙතත්, ඔහු ඒ හුස්මට ම ලද සෑම අවස්ථාවක දී ම තමන්ගේ 2010 න්‍යාය පත්‍රයෙන් මොන ම හේතුවක් නිසා වත් ඉවත්ව නොයන්නේ යැයි ද අවධාරනය කලේ ය. මෙම කොන්දේසි යටතේ සීඩීයූවට එස්පීඩීයට වැඩියෙන් තුබූ වාසිය මුලුමනින් ම අහිමි වී ගිය අතර සැප්තැම්බරයේ දී හුදු සියයට 35ක ඡන්ද ප්‍රතිශතයක් ලබමින් පක්ෂ ඉතිහාසයේ වඩාත් ම අයහපත් වූ මැතිවරන ප්‍රතිඵලයක් ලබා ගත්තේ ය.

ඒ හා සමග සිය පලමු ඡන්ද ආගමනයේ දී ම සුභසාධන කප්පාදුවට එරෙහිව උද්ඝෝෂනය කල වාමාංශික පක්ෂය ජාතික මට්ටමෙන් සියයට 9ක් (නැගෙනහිර ජර්මානු ප්‍රාන්තවලින් සියයට 27ක්) දිනා ගැනීමට සමත් විය.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් සහ හරිතයන් වාමාංශික පක්ෂය සමග එක්ව ගත් විට කොන්සර්වේටිව්වාදීන්ට වඩා වැඩි ආසන ගනනක් පාර්ලිමේන්තුව තුල හිමි කර ගැනීම නව-ලිබරල්වාදී දේශපාලන ගමන් මග පුලුල් ලෙස පිලිකෙව් කිරීමේ දර්ශකයකි. කෙසේ වෙතත් "වාමාංශික බහුතරයක්" සඳහා වෑයම් කරනු වෙනුවට එස්පීඩීය හා හරිතයෝ දකුනට පැද්දී යමින් සංගම් පක්ෂ (සීඩීයූ සහ සීඑස්යූ) සමග සහයෝගී වීමකට අත පෑවෝ ය.

## ප්‍රන්සයේ හා බෙල්ජියමේ වැඩ වර්ජන සහ ජනතා පෙලපාලි

මැතිවරනවල දීත් අනතුරුව එලඹෙන ආන්ඩුවක් පිහිටුවීමේ දීත් මෙවන් පැහැදිලි ආකාරයකට පන්ති ප්‍රශ්න මතු වීම බටහිර ජර්මනියේ පශ්චාත් යුද ඉතිහාසයේ කලාතුරකින් සිදු වූවකි. ජර්මනියේ මෙම වර්ධනයන් ඒවායේ යුරෝපා අන්තර්ගතයෙන් දැක ගැනීම වැදගත් ය.

අගමැති ඩොමිනික් ඩි විලොපෙ සහ ජනාධිපති ජැක් ශිරැක් යටතේ වන ගෝල්වාදී ආන්ඩුවේ නව-ලිබරල් ප්‍රතිපත්තිවලට එරෙහිව දසලක්ෂයකට වැඩි කම්කරුවෝ ඔක්තෝබර් 4 වන දා ප්‍රන්ස නගර 150ක පැවැත්වූ වර්ජන සහ පෙලපාලිවලට සහභාගි වූහ.

තෙදිනකට පසුව, විශ්‍රාම ක්‍රමයට විරුද්ධව අගමැති ගයි වෙනොෆ්ස්ටාඩ්ගේ ආන්ඩුව එල්ල කල ප්‍රහාරයන්ට එරෙහිව බෙල්ජියමේ ඇති වූ මහා වැඩ වර්ජනයකින් රට දින තුනක් තිස්සේ අඩපනව පැවතුනි. මෙය දස වසරකින් පසුව බෙල්ජියමේ ඇති වූ ප්‍රථම මහා වැඩ වර්ජනය යි.

පසු ගිය වසරේ විරෝධතාකරුවන් ලක්ෂ ගනනින් ඇද ගත් සිව් වන හාට්ස් කම්කරු ප්‍රතිසංස්කරනවලට එරෙහි පෙලපාලි මේ වසර මුල් භාගයේ ප්‍රන්සයේ සහ නෙදර්ලන්තයේ යුරෝපා සංගම් ව්‍යවස්ථාවට එරෙහිව ඡන්දය පාවිච්චි කිරීමෙන් කූලු ගැන්වුනු යුරෝපා වර්ධනයන්ගේ ම කොටසකි.

දේශපාලන ප්‍රභූව වඩාත් අදිටනින් යුතුව තම අරමුනු කරා ලඟා වීමට තීන්දු කරමින් මෙම පීඩනයට නීච ලෙස ප්‍රතික්‍රියා කලේ ය. චාන්සලර් මැකරල් යටතේ වන මහා සභාගයක් හාම්පුතුන්ගේ සංගම්වල උවමනාවන් අනුයන්නා වූ ද සමාජ කප්පාදු තව දුරටත් තීව්‍ර කරන්නා වූ ද ආන්ඩුවක් වනු ඇති බව දැනට මත් පැහැදිලි ය.

මැතිවරනයේ දී මර්කෙල් විසින් පෙන්නුම් කර දෙන ලද දේශපාලන මාවත අදිටන් සහගත ප්‍රතිරෝධයකට මුහුන දුන් නිසා, සමාජ ප්‍රහාර කර ගෙන යාමට ආන්ඩුවට ඇති හැකියාව සහතික කිරීමේ දී සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් දූන් තීරනාත්මක භූමිකාවක් රඟනු ඇත. මෑත ම ආරංචිවලට අනුව එස්පීඩීය වැදගත් ඇමති ධුර ගනනාවක් හොබවනු ඇති අතර කැබිනට් මන්ඩලය තුල සමාන නියෝජනයක් දරනු ඇත.

"සභාග සාකච්ඡා සඳහා පදනම" නම් ලියවිල්ලට අනුව සීඩීයූව චාන්සලර් පදවියට සහ කැබිනට් තනතුරක් වන චාන්සලර් කාර්ය මන්ඩල ප්‍රධානීත්වයට අමතරව මෙම ඇමති ධුර හය ද දරනු ඇත: ආර්ථික හා තාක්ෂනික, ස්වදේශ කටයුතු, ආරක්ෂක, පවුල්-කාන්තා-තරුන සහ අධ්‍යාපන- පර්යේෂන-ආහාර-කෘෂිකාර්මික.

එස්පීඩීයට විදේශ ඇමති හා උප චාන්සලර් තනතුරු ලැබෙතැයි බලාපොරොත්තු වන අතර ඔවුන් හොබවන අන් ඇමති ධුර හත වන්නේ; මුදල්, අධිකරන, කම්කරු සහ සමාජ සේවා, සෞඛ්‍ය, ගමනාගමන, සංවර්ධන ආධාර හා පරිසර කටයුතු ය.

නික්ම යන චාන්සලර් ශෘඩර්, මර්කෙල් ආන්ඩුවක විදේශ ඇමති ධුරය භාර ගනිමින් උප චාන්සලර් පදවියට පත් වේ දැයි යන්න පිලිබඳව පසු ගිය දින කිහිපය මුලුල්ලේ බොහෝ සමපේක්ෂන සිදු විය. ශෘඩර් මේ පිලිබඳව තව මත් අවසන් ප්‍රකාශයක් කර නැති නමුත්

මෙය තම අභිප්‍රාය නොවන බව දැඩි ලෙස අඟවා තිබේ. ඒ වෙනුවට හිටපු ආරක්ෂක ලේකම් පීටර් ස්ට්‍රක් (එස්පීඩී) ගැලපෙන අපේක්ෂකයකු ලෙස පෙරට දමනු ලැබේ. ශෲඩර්ගේ සමීප හා විශ්වාසවන්ත මිතුරකු වන ස්ට්‍රක් ආන්ඩුවේ දැඩි ක්‍රියාමාර්ගයන් කෲර ආකාරයකට ක්‍රියාත්මක කිරීම පිලිබඳව ප්‍රකට ය.

ඔහු ආරක්ෂක ලේකම් ලෙස රටේ මිලිටරියේ භූමිකාව දේශසීමා ආරක්ෂක බලකායක සිට ඉහලින් ම දියුනු කරන ලද ආක්‍රමනකාරී හමුදාවක් ලෙසට වෙනස් කරමින් ජාත්‍යන්තර මිලිටරි ක්‍රියාකාරකම් තුල ජර්මනියේ සහභාගිත්වය පෙරට දැමුවේ ය. ස්ට්‍රක් අනාගත විදේශ ඇමති ලෙස නිසැක ලෙසින් ම ඇමරිකානු ආන්ඩුව ද විශේෂයෙන් ම වොෂින්ටනයේ සිය සාමාන්‍යයා වන ඩොනල්ඩ් රම්ස්ෆෙල්ඩ් ද සමග තමන්ට මිතුරු සබඳතා ඇතැයි යන කාරනාව ද තැරැවි කරන අතරේ ම රුසියාව සමග වූ ශෲඩර්ගේ මිතුරුකම දිගට ම ගෙන යනු ඇත.

වෙනත් වචනවලින් කියතොත් ස්ට්‍රක් එලඹෙන ආන්ඩුවේ අපැහැදිලි විදේශ ප්‍රතිපත්ති දිශාවනතිය මූර්තිමත් කරන සම්මුතිකාරක අපේක්ෂකයෙකි. කර්මාන්තයන්හි ප්‍රමුඛ පෙල නියෝජිතයන් ශෲඩර් සහ රුසියානු ජනාධිපති පුටින් සමග වන ඔහුගේ සන්ධානයට පක්ෂපාතීව සිටිමින් ඇමරිකානු ආන්ඩුවේ ඉහල යන වැරදි ක්‍රියා පිලිබඳව අනතුරු අඟවන අතරේ අනාගත චාන්සලර් මර්කෙල් සහ සීඩීයූ නායකත්වයේ ඇයගේ දෙවැන්නා වන වුල්ෆැන් ශෝබල් ඇමරිකානු ආන්ඩුව සමග යලි මිතුරු වීමක් සඳහා පක්ෂ වෙති.

පත්‍ර වාර්තාවන්ට අනුව වුල්ෆැන් ශෝබල් නව ආන්ඩුවේ අභ්‍යන්තර කටයුතු ඇමති වනු ඇත. 1980 ගනන්වල සහ 1990 ගනන්වල හෙල්මුට් කෝල්ගේ සීඩීයූ ආන්ඩුවේ දීර්ඝකාලීනව ඇමතිවරයකු වූ ඔහු පෙර නැගෙනහිර ජර්මනිය විසුරුවා හැරීමේ දීත් ජර්මනිය ඒකාබද්ධ කිරීමේ දීත් මූලිකව මැදිහත් වූ අතර ක්‍රිස්තියානි ප්‍රජාතන්ත්‍රවාදයේ අන්ත දක්ෂිනාංශිකයෙක් වෙයි. ඔහු සීඩීයූවේ අත්දැකීම් බහුල ම දේශපාලනඥයෙකි.

බැවේරියානු සීඑස්යූවේ නායකයා වන එඩ්මන්ඩ් ස්ටොයිබර් ශෝබල් සමග එක් පෙලට වන ඇන්ජලා මර්කෙල්ට සමීප තවත් දේශපාලන දන්ඩෙකි. ඔහු ආර්ථික අමාත්‍යාංශයට ඉගි කෙරී ඇති අතර තාක්ෂන වර්ධනයට වගකියනු ඇත. වසර තුනකට පෙර පැවති ඡන්දයේ දී ශෲඩර් ලඟට ම පැමින දෙවැන්නා වූ ස්ටොයිබර් වසර 40කට පෙර දේශපාලන වෘත්තිය ඇරඹුවේ දක්ෂිනාංශික කොන්සවේටිව් බැවේරියානු අග්‍රාමාත්‍ය ෆ්‍රාන්ස්-ජෝශප් ස්ට්‍රෝස්ගේ කාර්යාල කලමනාකරු ලෙස ය.

සුඩොයිෂෙ සෙයිටුන් පුවත්පත සමග කල සාකච්ඡාවක දී ඔහු මහා සභාගය "අතිවිශාල අවස්ථාව"ක් ලෙස පැවසී ය. එස්පීඩීය හා සීඩීයූ/සීඑස්යූවලින් සැදුම් ලත් ආන්ඩුවක් පක්ෂ දෙක එකිනෙකට පසමිතුරුව දේශපාලන ගිරයකට අසු වීමක් වනු ඇතැයි යන හාම්පුතුන්ගේ සම්මේලන අනතුරු ඇඟවීමට පරස්පරව සටොයිබර් නව සභාග ආන්ඩුව මාහැඟි දේශපාලන අවස්ථා සම්පාදනය කරනු ඇතැයි අවධාරනය කලේ ය.

මීලඟ ආන්ඩුව අවධානය යොමු කල යුතු ක්ෂේත්‍ර තුනක් නම් කරමින් ඔහු පුවත්පතට පැවසුවේ මෙය යි, "වැදගත් මාතෘකා ගනනාවක් තිබේ". "දීර්ඝකාලීන ඉතුරුම්" සාක්ෂාත් කරනු පිනිස "අයවැය ප්‍රතිසංස්කරන," එනම් තවතවත් සමාජ වියදම් කප්පාදු. දෙවනුව, "සමාජ ආරක්ෂක පද්ධතියේ ප්‍රතිසංස්කරන," වෙනත් වචනවලින් නම් විශ්‍රාම හා සමාජ ආරක්ෂනයේ කප්පාදු. තුන් වනුවඃ "කඩිනම් ෆෙඩරල් ප්‍රතිසංස්කරන සඳහා හොඳ ම වේදිකාව මහා සභාගයක් ය." සියල්ලට මත් වඩා ප්‍රාන්ත මූල්‍යය විශාල පරිමානයෙන් ප්‍රතිව්‍යුහගත කිරීම්, එනම්, විවිධ ප්‍රාන්ත ආන්ඩුවලට වන්දි ලෙස අරමුදල් සැපයීම විශාල ලෙස අහෝසි කිරීම සහ විවිධ ප්‍රාන්ත සහ කලාප අතර ඉහල තරගකාරිත්වයක් දිරි ගැන්වීම මෙයට ඇතුලත් ය. මේ හා බැඳී දරිද්‍රතාව සහ කලාපීය අසමානතාව ඉහල යාම වන්දි ගෙවීමට යන්නේ වඩා ශක්තිමත් මධ්‍යගතකරනයකිනි.

එමෙන් ම, "රැකියා සඳහා සන්ධානය"ට යලි පන දීම මගින් වෘත්තීය සමිති ඇද ගැනීමට තමන්ට අවශ්‍ය බව ද ඇන්ජලා මර්කෙල් නිවේදනය කලා ය. මෙය වනාහි ශෲඩර් ආන්ඩුව විසින් හඳුන්වා දෙනු ලැබූ, ආන්ඩුවේ නියෝජිතයන්, වෘත්තීය සමිති නායකයන් හා ව්‍යාපාරික කන්ඩායම් අතර සහයෝගිතාව පිලිබඳ සැලසුමකි. මෙහි එල්ලය වන්නේ, සේවා කොන්දේසි තියුනු වෙනස්කම්වලට භාජනය කිරීමේ ආන්ඩුවේ සැලසුම්වලට වෘත්තීය සමිති නායකත්වය ඒකාග්‍ර කර ගනු පිනිස එස්පීඩීය සමග සභාග ආන්ඩුවේ සහයෝගිතාව ගසාකෑම යි. රැකියාවන්හි ආරක්ෂාවට සහ පවත්නා තීරු බඳු ගිවිසුම්වලට ක්‍රමයෙන් වල කැපීමට නියමිත ය.

මහා සභාගය නිර්මානය කිරීම වටා වූ ආරම්භක ප්‍රකාශ සහ පියවර මගින් පැහැදිලි වන්නේ, එය වනාහි ව්‍යාපාරික සම්මේලවල අවශ්‍යතා අනුව ක්‍රියාත්මක වන අතිශයින් ම කොන්සෙවේටිව් ආන්ඩුවක් වනු ඇති බව යි. කම්කරු පන්තිය සිය සමාජ හා දේශපාලන අයිතීන් මත එල්ල වන ප්‍රචන්ඩ ප්‍රහාරයන්ට මුහුන දීමට සූදානම් විය යුතු ය.

මෙම කරුණේ දී වාමාංශ පක්ෂය විශේෂ අනර්ථකාරී ක්‍රියා කලාපයක් ඉටු කරයි. තෙසතියකට පෙර තිබූ මැතිවරනයෙන් පසු මේ පක්ෂයෙන් වචනයක් අසන්නට නැති තරම් ය. එහි නායකයන් වන ඔස්කා ලැෆොන්ටේන් සහ ග්‍රිගොර් යයිසි යලියලිත් කියා සිටියේ එස්පීඩීය මහා සභාගයක සිටීම හේතුවෙන් සංගම් පක්ෂ මගින් සැලසුම් කරන නරක ම ප්‍රහාර යහපත් දිශාවකට යොමු කරවීමට ක්‍රියා කරනු ඇතැයි යන්න ය. වාමාංශ පක්ෂය පිහිටුවීමට ප්‍රජාතාන්ත්‍රීය සමාජවාදයේ පක්ෂය සමග එක් වූ "මැතිවරන විකල්පයෙහි" (ඩබ්ලිව්ඒඑස්ජී) සභාපති වන ක්ලෝස් අර්නිස්ට් ඉරිදා ජර්මානු රූපවාහිනියට පැවසුවේ එස්පීඩීය තමන්ගේ ස්වයං-ආරක්ෂාව සඳහා ම සංගම් පක්ෂ සමග සභාගයේ දී සමාජමය මධ්‍යස්ථ මාවතක් අනුගමනය කරනු ඇතැයි යනුවෙනි.

සිදු වී තිබෙන්නේ මෙහි අනෙක් පැත්ත ය. මෙවන් ප්‍රකාශයන්ගෙන් වාමාංශ පක්ෂය මහා සභාගයට අභියෝග කිරීමට ඔවුන්ට තිබෙන නොහැකියාව පෙන්නුම් කරන අතරේ කම්කරුවන් හා රැකියා නැතියවුන් හුදෙක් අවමංගත කරවයි. එස්පීඩී-හරිත පක්ෂ සභාගයේ හත් වසර, ප්‍රජාතාන්ත්‍රීය සහ සමාජ අයිතීන්වලට එල්ල කල ඉතා ම ආක්‍රමනශීලී ප්‍රහාරයන්ගෙන් මූර්තිමත් වූ, පක්ෂ දෙකේ ම නොනිමි දක්ෂිනාංශික ගමන සටහන් කර තැබීමට ප්‍රමානවත් ය. එස්පීඩීය බලය බෙදාහදා ගන්නා නැගෙනහිරදිග ප්‍රාන්තවල දී එවැනි ප්‍රහාරයන්ගේ පෙරමුනේ ම සිටියේ ඔවුන් ය.

බර්ලිනයේ නව සභාග ආන්ඩුවක් තේරී පිහිටුවා ගැනීම මගින් පැහැදිලි වන්නේ පුලුල් කම්කරු පන්තික මහජනතාවට නව දේශපාලන දිශානතියක් ලබා ගත හැකි වනුයේ එස්පීඩීය සහ වාමාංශ පක්ෂය යන දෙකෙන් ස්වාධීනව පමනක් ම ය යන්න යි. ජාත්‍යන්තර සමාජවාදී ක්‍රියා මාර්ගයක් මත පදනම්ව එවැනි විකල්පයක් සම්පාදනය කිරීමට මැතිවරනයට මැදිහත් වූ එක ම පක්ෂය වූයේ සමාජවාදී සමානතා පක්ෂය (පීඑස්ජී) යි.

© www.wsws.org